**මහඔය ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**
**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජූලි 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට මහඔය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) 2013 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ ඉදිකර 2018 වර්ෂයේදී ප්‍රාදේශීය සභාවට පවරන ලද මහඔය බස් නැවතුම් පොළ කඩකාමර වල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මහඔය බස් නැවතුම්පොල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා ඇතත් එහි වටිනාකම පිළිබද කිසිදු ලියවිල්ලක් අප වෙත ලබා දී නැත. එම වටිනාකම අපවෙත ලැබුණු පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) මඩුගල පිළිසරු මධ්‍යස්ථානය වටා අලි වැට ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් ගෙවිය යුතු වියදම් රු.1,099,790 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදී මෙය නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (iii) 2015 සිට 2018 වර්ෂය දක්වා ලැබිය යුතු රු.186,885 ක මුද්දර ගාස්තු ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) සමාලෝචිත වර්ෂයේ මිලදීගත් රු.670,280 ක පරිභෝජන ද්‍රව්‍ය මෝටර් රථ හා කරත්ත යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| (v) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු වැටුප් රු.358,360 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (vi) සමාලෝචිත වර්ෂය අවසානයට කඩකාමර තැන්පතු රු.328,385 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ආ)** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| ගෙවිය යුතු ගිණුම්<br>2013 සිට 2018 වර්ෂය දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු රු.332,675 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ)** **විගණනය සඳහා අවශ්‍යා ලිඛිත සාක්ෂි නොමැති වීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| රු.126,125,326 ක වත්කම් විෂයයන් 04 ක් හා රු.5,817,796 ක වගකීම් විෂයන් 02 ක් විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | පිළිගනිමි. ඉදිරියේ දී ලේඛන සකස් කර යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කරමි. |

**1.4** **අනුකූල නොවීම**

**නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම්** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|---|
| | **(රු.)** | | | |
| (අ) **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ-**<br>(i) 126 වගන්තිය | - | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අතුරු ව්‍යවස්ථා | සභා පනතේ සඳහන් කර ඇති | පිළිගනිමි. ඉදිරියේදී කොම්පොස්ට් නිෂ්පාදනය වැඩිකර |

| | | | | |
|---|---|---|---|---|
| | | පනවා අදාල වියදම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අලෙවි කිරීමට කටයුතු කරමි. |
| (ii) 159 වගන්තිය | 3,163,087 | ප්‍රාදේශීය සභාව සතු කඩකාමර 69 කින් හිඟ කඩ කුලී අයකර ගෙන නොතිබුණි. | සභා පනතේ සඳහන් කර ඇති විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට කැකිරිහේන කඩ කාමර 24 හැර අනෙකුත් කඩ කාමර 45 න් කඩ කුළිය අයකර ගෙන ඇති බව සඳහන් කරමි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571** | 875,715 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු 154 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේ දී මෙම තැන්පතු ආදායම නැවත ආදායමට ගැනීමට අදාළ කටයුතු සිදුකරන බව දන්වමි. |
| **(ඇ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | - | ප්‍රාදේශීය සභාව සතු වාහන 10 ක ඉන්ධන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. |
| **(ඇ) පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍රලේඛය** | | සභාව සතු බදු දී තිබුණු කඩකාමර 63 ක කුලිය වර්ෂ 05 කට වරක් තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | කඩ කාමර අවසන් වරට 2014 වර්ෂයේ තක්සේරු කර ඇති අතර ඉදිරියේ දී කඩ කාමර නැවත තක්සේරු කිරීමට කටයුතු කරන බව දන්වමි. |

**2.** **මූල්‍ය සමාලෝචනය**
**----------------------**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**
**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.96,551 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,465,381 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම් | 2019 බිල්කළ ආදායම් | 2019 රැස්කළ ආදායම් | 2019 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම් | 2018 බිල්කළ ආදායම් | 2018 රැස්කළ ආදායම් | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| වරිපනම් හා බදු | 450,000 | 591,000 | 591,000 | - | 400,000 | 439,200 | 439,200 | - |
| කුලී | 9,247,200 | 11,715,822 | 8,552,735 | 3,163,087 | 7,531,343 | 8,179,086 | 6,743,169 | 1,435,927 |
| බලපත්‍ර ගාස්තු | 340,500 | 332,358 | 332,358 | - | 290,400 | 348,764 | 348,764 | - |
| වෙනත් ආදායම් | 5,693,400 | 7,292,460 | 6,623,235 | 669,225 | 5,043,869 | 8,215,727 | 7,860,876 | 354,852 |
| | **15,731,100** | **19,931,640** | **16,099,328** | **3,832,312** | **13,265,612** | **17,182,777** | **15,392,009** | **1,790,779** |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශය මූලික පහසුකම් වලින් සමන්විත ප්‍රදේශයක් වුවද, මේ දක්වා වරිපනම් බදු අය කිරීමක් සිදුකර නොතිබුණි. | වරිපනම් අයකිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර ගැනීම සුදුසුය. | 2018 ජූලි මස පවත්වන ලද සභාවාරයේ දී 2018/07/එස් ඩී/08 සභා තීරණය යටතේ වරිපනම් බදු පැනවීම සඳහා සභා අනුමැතිය ලබාගෙන ඇත. ඒ සඳහා කමිටුවක් ද පත්කර ඇත. එම කමිටුව විසින් වරිපනම් බදු අයකර ගැනීම සඳහා සුදුසු ප්‍රදේශ හඳුනාගෙන 2019 අප්‍රේල් මස සභාවට ඉදිරිපත් කර ඇත.එහිදි ඒ සඳහා අනුමැතිය ලබා දීම සභාව විසින් පසුවට කල්තබන ලදී. වරිපනම් අයකිරීම සඳහා හඳුනාගත් ප්‍රදේශ සඳහා සභා අනුමැතිය ලැබී නොමැත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

#### (අ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.324,850 ක් විය. | හිඟ මුද්දර ගාස්තු අයකර ගත යුතු වේ. | 2019.12.31 දිනට ලැබිය රු.324,850.00 ක් වූ මුද්දර ගාස්තු මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට අවශ්‍ය කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 05 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | මේ වන විට පනවා ඇති අතුරු ව්‍යවස්ථා 05 ට අමතරව තවත් අතුරු ව්‍යවස්ථා 08. ක් සැදීම සඳහා 2020.07.10 වන දින පැවති මාසික මහ සභාවේ දී තීරණය කරන ලදී. |

### (ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. | සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර 2018 වර්ෂයේ සිට 2022 දක්වා කාලයකට යාවත්කාලීන වන පරිදි ක්‍රියාකාරී සැලැස්මක් සකස් කොට ඇත. |

### (ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ "තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030" පිළිබඳව දැනුවත් වී තිබුණු නමුත් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන නොතිබුණි. | ඉලක්ක හා අරමුණු හඳුනාගෙන ස්ථාපිත කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කැකිරිහේන සතිපොළ කඩකාමර 24 ක් 2015 හා 2017 වර්ෂවලදී ගිවිසුම්ගත වී බදුකරුවන්ට භාර දී තිබූ නමුත් ඉහත කඩකාමර වලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු හිඟ කඩ කුලි හා දඩ මුදල් රු.2,165,428 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ කඩකුලී හා දඩ මුදල් හා අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මහඹය කැකිරිහේන කඩ කාමර බදු කුළිය මත ලබා දුන්නද වෙළදාම් කටයුතු සඳහා මෙතෙක් විවෘත නොකරන බැවින් 2019.09.12 වන දින පැවති මාසික සභා වාරය මගින් 2019.09.12 වන දිනට හිඟ කඩ කුලී මුදල වන රු.1,905,733 ක මුදල කපා හැරීමට තීරණය කරන ලදී.<br><br>එම තීරණය 2019.10.28 වන දින ප්‍රාදේශීය පළාත් පාලන කොමසාරිස්තුමා මගින් පළාත් පාලන කොමසාරිස්තුමා මා වෙත එම මුදල කපා හැරීම සඳහා අනුමැතිය ලබාදෙන ලෙස දන්වා ලිපියක් යොමු කළ ද මේ වන විටත් එම ලිපිය සඳහා පිළිතුරු ලැබී නැත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 06 ක පුරප්පාඩු 07 ක් පැවතුනි. | කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගතිමි. |
| (ආ) 2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා සේවය කර ස්ථාන මාරුවී ගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.25,359 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි. | අය නොවී පවතින සේවක ණය අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | නිළධාරීන් 06 දෙනෙකුගෙන් අයවිය යුතු රු.25,359.00 මුදල අයකර ගැනීමට එම නිළධාරීන් වෙත ලිපි යොමු කර ඇති අතර ඔවුන් එම මුදල ලබා දීමට කටයුතු කර නොමැත. |
| (ඇ) සභාව විසින් ස්ථිර පදනමින් 1996 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුල බඳවාගෙන තිබුණු මාර්ග කම්කරුවන් 04 දෙනෙකු හා සෞඛ්‍ය කම්කරුවන් 03 දෙනෙකු අදාල රාජකාරි සඳහා යොදවා නොගෙන වෙනත් රාජකරි සඳහා යොදවාගෙන තිබුණි. | බඳවාගනු ලබන කම්කරුවන් තනතුරට අදාල රාජකාරියේ යෙදවිය යුතු වේ. | මහඹය ප්‍රාදේශීය සභාවේ කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බැවින් සිටින නිලධාරීන් නිත්‍ය තනතුරේ නොයොදා අවශ්‍යතා මත රාජකාරී වෙනුවෙන් වෙනත් රාජකාරී කටයුතු සඳහා යෙදවීමට සිදුවිය. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොම්පෝස්ට් අංගනය සඳහා ජල සැපයුම ලබාගැනීම වෙනුවෙන් අම්පාර ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය වෙත 2017 වර්ෂයේදී රු.828,115 ක මුදලක් මධ්‍යම පරිසර අධිකාරිය මඟින් ගෙවීම් කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ජල සැපයුම ලබාගෙන නොතිබීම හේතුවෙන් එම ස්ථානයේ කොම්පෝස්ට් නිපදවීමේ ක්‍රියාවලියට අවශ්‍ය ජලය සභාව සතු බවුසර රථ මඟින් ප්‍රවාහනය කිරීමට සිදුවීම නිසා ඒ සඳහා අමතර වියදමක් දැරීමට සිදු වී තිබුණි. | කඩිනමින් කොම්පෝස්ට් අංගනය සඳහා ජල සැපයුම ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | කොම්පොස්ට් අංගනයට නළ ළිදක් ඉදිකර ජලය ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය මුදල් ලබා දුන් අතර එම ස්ථානය පරික්ෂා කිරීමට පැමිණි ජල සම්පාදන හා ජලපවහන මණ්ඩලයේ නිළධාරීන් එම ස්ථානයේ නළ ළිදක් ඉදි කිරීමට නුසුදුසු බව ප්‍රකාශ කිරීම හේතුවෙන් එම ස්ථානයට නළ ජලය ලබා දෙන ලෙස ජල සම්පාදන හා ජල පවහන මණ්ඩලයට ලිඛිතව කිහිප වරක් ඉල්ලීම් කර ඇතත් මේ වනතෙක් ජලය ලබා දීමට කටයුතු කර නොමැත. |

### 3.5 වත්කම් කළමනාකරණය

#### 3.5.1 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) සභාව විසින් භාවිතා කරන වාහන හා යන්ත්‍රෝපකරණ 06 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහන හා යන්ත්‍රෝපකරණ වල අයිතිය සභාව වෙත පවරා ගත යුතු වේ. | පිළිගනිමි. අදාල වාහන සහ යන්ත්‍රෝපකරණ වල අයිතිය පවරා ගැනීම සම්බන්ධයෙන් සහා අනුමැතිය ලබා ගැනීම උදෙසා ගරු සභාව වෙත ලිපියක් යොමු කිරීමට කටයුතු කොට ඇත. |
| (ආ) සභාවේ විවිධ කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන ඉඩම් කැබලි 36 ක් පවරාගෙන නොතිබුණි. | ඉඩම් වල නීත්‍යානුකූල අයිතිය පවරා ගත යුතු වේ. | ප්‍රාදේශීය සභාවට අයත් සියලු ඉඩම් පවරා ගැනීමට අදාළව ඉල්ලීම් කර ඇත. |

### 3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝගිතා වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රයෝජනයට ගත හැකි යතුරු පැදි 02 ක් වර්ෂ 10 ක පමණ සිට කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | වාහන ප්‍රයෝජනයට ගත යුතු වේ. | ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික ලබා ගැනීමට අවශ්‍ය ලිපි ලේඛන නොමැති වීම නිසා ප්‍රයෝජනයට ගත නොහැක. |

### 3.5.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාහන 02 ක ආදායම් බලපත්‍ර ලබා ගැනීමට 2019 වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි. | ආදායම් බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පිළිගනිමි.<br>ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරමි. |

## 3.6 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | එක් එක් වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු වේ. | 2020 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇත. |